## විශේෂ සටහන 2

## මැදි හා දිගු කාලීනව ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ ස්ථායීතාව ළඟා කර ගැනීම

### හැඳින්වීම

බාහිර අසමතුලිතතා ආර්ථිකයේ සියලුම අංශ හරහා පුළුල් ලෙස පැතිර යන බලපෑම් ඇති කළ හැකි අතර එය සමස්ත සාර්ව ආර්ථික ස්ථාවරත්වයට තර්ජනයක් ඇති කළ හැකි බැවින් විවෘත ආර්ථිකයක් තුළ විදේශීය අංශයේ ස්ථාවරත්වය ඉතා වැදගත් වේ. ගෝලීය ආර්ථිකයේ අහිතකර වර්ධනයන් සහ කොවිඩ්-19 වසංගතය නිසා ඇති වූ බලපෑම් මධ්‍යයේ, ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මෑත වසරවල දී පෙර නොවූ අන්දමේ අභියෝගවලට මුහුණ දෙමින් සිටියි. මෙම වාතාවරණය තුළ, තිරසාර විදේශීය ණය තත්ත්වයකින් සහ කළමනාකරණය කරගත හැකි මට්ටමේ විදේශීය ජංගම ගිණුමේ හිඟයකින් පිළිබිඹු කෙරෙන විදේශීය අංශයේ දිගු කාලීන ස්ථාවරත්වය, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේ දී වැදගත් කෙටි හා මැදි කාලීන ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන ඇත. කෙටි කාලීන ක්‍රියාමාර්ග ද සමඟ, විදේශීය අංශයේ දිගු කාලීන ස්ථාවරත්වය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවට තිරසාර විසඳුම් අවශ්‍ය වේ.

### ශ්‍රී ලංකාවේ විදේශීය අංශයට අදාළ ආර්ථික ප්‍රතිපත්තිවල පරිණාමය

බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලබන විට ශ්‍රී ලංකාව කෘෂිකර්මාන්තය මූලික වූ විවෘත ආර්ථිකයක් වූ අතර, එය ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයක් සහිත වැවිලි අංශයකින් සහ යැපුම් කෘෂිකාර්මික අංශයකින් සමන්විත විය. අපනයන, තේ, රබර් සහ පොල් යන ප්‍රධාන වැවිලි භෝග තුනක් මත පදනම් වූ අතර, එය සමස්ත අපනයනවලින් සියයට 90ක් පමණ විය.

### නිදහසින් පසු යුගයේ පැවති විදේශීය අංශයේ ප්‍රතිපත්ති

#### *1950 දශකයේ මුල් භාගයේ පැවති නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය*

ශ්‍රී ලංකාව නිදහස ලැබූ මුල් අවධියේ නිදහස් වෙළඳ ප්‍රතිපත්තියක් පවත්වා ගෙන ගිය අතර, එය ආසියාවේ වඩාත්ම ලිබරල්කරණය වූ ආර්ථිකයන්ගෙන් එකක් විය. 1950 දශකයේ අග භාගය වන තුරුම, විදේශ සංචිත සැලකිය යුතු ලෙස ගොඩනැංවීමට තුඩු දුන් වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම් ද්විත්වයකින් සහාය ලැබූ විශාල වෙළඳ අතිරික්තයන් සමඟ විවෘත වෙළඳ ප්‍රතිපත්තිය පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය. කෙසේ වෙතත්, ආනයන වියදම්වල වේගවත් වර්ධනය සහ වෙළඳ මිල අනුපාතය පිරිහීම හේතුවෙන් 1957 සිට වෙළඳ ගිණුමේ සැලකිය යුතු හිඟයන් වාර්තා විය.

#### *1950 දශකයේ මැද භාගයේ සිට 1960 දශකයේ මැද භාගය දක්වා පැවති ආනයන පාලනය*

1956න් පසු, දළ නිල සංචිත සැලකිය යුතු ලෙස අඩු වීමට හේතුපාදක වෙමින් විශාල වෙළඳ හිඟයන් ගෙවුම් තුලනය මත පීඩන ඇති කළේය. ඊට ප්‍රතිචාර වශයෙන්, රජය විසින් විදේශ විනිමය අයවැය කම්ටුවක් පිහිටුවීම හරහා ආහාර, ඛනිජ තෙල් සහ ඖෂධ ආනයනය හැර අනෙකුත් ආනයන සඳහා ආනයන ප්‍රමාණය මත සීමා පැනවීම, බලපත්‍ර අවශ්‍යතා සහ තීරු බදු පැනවීම ඇතුළු දැඩි ආනයන පාලන ක්‍රියාමාර්ග පනවන ලදී. රජයේ සංවර්ධන උපායමාර්ගය, ආනයන ආදේශන දිරිමත් කිරීම සහ දේශීය කෘෂිකාර්මික කටයුතු පුළුල් කිරීම තුළින් ආනයන වියදම් අඩු කිරීම සහ අත්‍යවශ්‍ය භාණ්ඩවලින් ස්වයංපෝෂිත වීම මත පදනම් විය. 1960 දශකයේ මැද භාගය වන විට, ආරක්ෂණවාදී පියවර සමඟ ආර්ථිකය දැඩි ලෙස නියාමනය කරන ලද අතර, අධි තක්සේරු කරන ලද ස්ථාවර විනිමය අනුපාතිකයක් පවත්වා ගෙන යන ලදී. මේ අතර, ගෙවුම් තුලනයේ ගැටලුවලට විසඳුම් ලෙස අපනයන ප්‍රවර්ධන උපාය මාර්ග ද අනුගමනය කරන ලදී.

#### *1960 දශකයේ අග භාගයේ සිට 1970 දක්වා පැවති ආර්ථිකයේ අර්ධ ලිබරල්කරණය*

1967දී මුදල් ඒකකය සියයට 20කින් අවප්‍රමාණය කිරීමත් සමඟ ආනයන සීමා කිරීම් අර්ධ වශයෙන් ලිහිල් කිරීමත්, 1968 වසරේ දී විදේශ විනිමය හිමිකම් සහතික කිරීමේ යාන්ත්‍රණය යටතේ ද්විත්ව විනිමය අනුපාතික ක්‍රමයක් හඳුන්වා දීමත් සමඟ 1966 වසරේ සිට ජාත්‍යන්තර වෙළඳාම අර්ධ වශයෙන් ලිහිල් කිරීමට අවසර දෙන ලදී. එම කාලසීමාව තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි බහුපාර්ශ්වීය ආයතනවලින් විදේශ මූල්‍ය ආධාර ලැබුණද, 1960 දශකයේ දී විදේශීය අංශයේ කාර්ය සාධනය සැලකිය යුතු ලෙස දුර්වල විය.

#### *1970 සිට 1977 දක්වා කාලය තුළ ආනයන පාලනය කිරීම් නැවත ක්‍රියාත්මක කිරීම*

1970 වසරේ දී බලයට පත් වූ නව රජය විසින් හඳුන්වා දෙන ලද සමාජවාදී ප්‍රතිපත්ති සමඟ ශ්‍රී ලංකාව මෙම කාල සීමාව තුළ වඩාත්ම දැඩි වෙළඳ හා විනිමය සීමාවන්ට මුහුණ දුන්නේය. සියලුම ආනයන, බලපත්‍ර අවශ්‍යතා මත ගෙන්වනු ලැබූ අතර, සාම්ප්‍රදායික නොවන අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා දිරි ගැන්වීම් සිදු කරන ලදී. බ්‍රෙටන් වුඩ්ස් (Bretton Woods) විනිමය අනුපාතික ක්‍රමයෙහි බිඳවැටීමට තුඩු දුන් තෙල් අර්බුදයක්, වියට්නාම යුද්ධය සහ එක්සත් ජනපද ආර්ථිකයේ ව්‍යුහාත්මක දුර්වලතා වැනි ගෝලීය බලපෑම්වලට මෙම කාලසීමාව තුළ දී ශ්‍රී ලංකා ආර්ථිකය ද මුහුණ දුන්නේය. බ්‍රෙටන් වුඩ්ස් ක්‍රමය බිඳවැටීම සහ ගෙවුම් තුලන පීඩන හේතුවෙන් එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය වෙනස් වීමත් සමඟ, ජංගම සහ ප්‍රාග්ධන ගිණුම් වලට අදාළ ගනුදෙනු දෙකෙහිම විනිමය සීමා කිරීම් දැඩි කරන ලද අතර, මෙම දැඩි පාලනයන් 1977 වසර දක්වා ක්‍රියාත්මක විය.

1

***1977 දී විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වාදීම***

නිෂ්පාදනය සහ ආයෝජනය සඳහා පෞද්ගලික අංශයේ ඉහළ සහභාගීත්වයක් සහිත ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීම තුළින් 1977 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය කැපී පෙනෙන සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. ලිබරල් ප්‍රතිපත්ති ක්‍රමයේ වැදගත් අංගයක් ලෙස තනි විනිමය අනුපාතිකයක් ස්ථාපිත කිරීම මගින් ද්විත්ව විනිමය අනුපාතික ක්‍රමය අහෝසි කරන ලදී. ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයක සිට වෙළඳපොළ ඉල්ලුම් සහ සැපයුම් බලවේග මත විනිමය අනුපාතිකය තීරණය කෙරෙනු ලබන කළමනාකරණය කරන ලද පාවෙන විනිමය අනුපාතික ක්‍රමයකට මාරුවීම, ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතික ප්‍රතිපත්තියේ කැපී පෙනෙන වෙනසක් සනිටුහන් කළේය. විනිමය පාලන ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග රැසක් ද ක්‍රියාත්මක කරන ලදී. ජංගම ගිණුමට අදාළ ගනුදෙනු මත පැවති සීමා ඉවත් කිරීම, ප්‍රමාණාත්මක ආනයන සීමා ඉවත් කිරීම, ආනයන තීරුබදු ව්‍යුහය තාර්කික කිරීම හා සරල කිරීම සහ මිල පාලන හා බලපත්‍ර අවශ්‍යතා ඉවත් කිරීම මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ඇතුළත් විය. මීට සමගාමීව, රාජ්‍ය මූල්‍ය අංශයේ අසමතුලිතතා හේතුවෙන් පැන නගින ලද අහිතකර බලපෑම් අවම කිරීම සඳහා, ආහාර සහනාධාර ප්‍රතිව්‍යුහගත කිරීම, රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලීකරණය කිරීම සහ පෞද්ගලික අංශය මූලික කරගත් වර්ධනය ප්‍රවර්ධනය කිරීම වැනි බොහෝ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලදී. අපනයන කර්මාන්ත සහ අපනයන සැකසුම් කලාප වෙත විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා දිරිගැන්වීම් ලබා දෙන ලදී. විනිමය සීමා ලිහිල් කිරීමත් සමග 1977 වසරෙන් පසු විදේශ මූල්‍ය ප්‍රවාහ ලැබීම් ක්‍රමයෙන් ඉහළ යෑම ඇරඹුණි. ඉන් පසුව, ආර්ථිකය මූලික වශයෙන් කෘෂිකාර්මික ආර්ථිකයක සිට සේවා සහ කාර්මික අංශ මූලික වූ ආර්ථිකයක් දක්වා වෙනස් වීමත් සමග, ශ්‍රී ලංකාව කලාපීය රටවල් සමග වෙළඳ හා ආයෝජන සබඳතා ශක්තිමත් කරගැනීම සඳහා වරණීය වෙළඳ ගිවිසුම් ගණනාවකට එළඹුණි.

**විදේශීය අංශය: වත්මන් තත්ත්වය සහ ගැටළු**


***අඛණ්ඩව ඉහළ යන ජංගම ගිණුමේ හිඟයන්***

වෙළඳ භාණ්ඩ ගිණුමේ සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ විශාල හිඟයන් හේතුවෙන් ශ්‍රී ලංකාව පසුගිය වසර කිහිපය පුරාම අඛණ්ඩව විදේශීය ජංගම ගිණුමේ හිඟයන් අත්විඳිමින් සිටියි. සේවා වෙළඳාම් ගිණුමේ සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සමන්විත ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්ත වාර්තා වුව ද, මෙම අතිරික්ත, ජංගම ගිණුම මත වන වෙළඳ භාණ්ඩ සහ ප්‍රාථමික ආදායම් ගිණුම්වල හිඟයන්ගේ බලපෑම මැඩපැවැත්වීමට ප්‍රමාණවත් නොවීය. අපනයන ඉපැයීම්වල අඩු කාර්ය සාධනය සහ ආනයන වියදම් ඉහළ යෑම වසර ගණනාවක් පුරා වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය පුළුල් වීමට හේතු විය. ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කිරීම ආරම්භ කළ කලාපයේ පළමු රටවල්වලින් එකක් බවට 1977 වසරේ දී ශ්‍රී ලංකාව පත් වුව ද, මෙරට වෙළඳ විවෘතභාවය පහළ මට්ටමක පවතී. රටේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව අපනයන හා ආනයනවල මුළු වටිනාකම ලෙස අර්ථ දක්වන වෙළඳ විවෘතභාවය, 1977 වසරේ දී සියයට 36.4ක් වූ අතර එය 1979 වසර වන විට සියයට 72.2ක් දක්වා ආසන්න වශයෙන් දෙගුණයක් බවට පත් විය. කෙසේ වෙතත්, 2019 වසරේ දී ශ්‍රී ලංකාවේ වෙළඳ විවෘතභාවය සියයට 38.0ක් ලෙස ලිබරල්කරණයට පෙර පැවති මට්ටම්වලට පහත වැටුණු අතර, වෙළඳ විවෘතභාවය සම්බන්ධයෙන් සලකා බලන විට ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික වෙළඳාමේ කාර්ය සාධනය සතුටුදායක මට්ටමක නොපවතියි. ජංගම ගිණුම් හිඟයන් පුළුල් කිරීමට දායක වෙමින් 2021 වසරේ මැද භාගයේ සිට විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ද පහත වැටීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත.

***පාස්කු ඉරු දින ප්‍රහාර සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ජංගම ගිණුමට ඇති වූ අහිතකර බලපෑම්***

ආනයන වියදම් අඩු වීම හේතුවෙන් වෙළඳ හිඟයේ ඇති වූ කැපී පෙනෙන අඩු වීම නිසා ජංගම ගිණුමේ හිඟය 2019 සහ 2020 වසර වල දී සැලකිය යුතු ලෙස අඩු වුවද, පාස්කු ඉරු දින ප්‍රහාර සහ කොවිඩ්19 වසංගතය පැතිරීම හමුවේ සංචරණ සීමා පැනවීම හේතුවෙන් සංචාරක ඉපැයීම් අහිමි වීම සේවා ගිණුමේ අතිරික්තයට වසර දෙකෙහිදී ම දැඩි බලපෑමක් එල්ල කළේය. 2020 වසර අවසානයේ සිට සංචාරක අංශය සැලකිය යුතු ලෙස යථා තත්ත්වයට පත්වීමක් දක්නට ලැබුණ ද, එය තවමත් වසංගතයට පෙර පැවැති මට්ටමට ළඟා වී නොමැත. වසංගත කාලය ආරම්භයේ දී පහත වැටුණු විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2020 වසරේ මැද භාගයේ සිට සීඝ්‍රයෙන් ඉහළ යෑම ඇරඹුණි. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් අවිධිමත් වෙළඳපොළ සහ විධිමත් මාර්ග අතර පවතින විනිමය අනුපාතිකයේ වෙනස්කම් හේතුවෙන්

රූප සටහන වි.ස. 2.1
ජංගම ගිණුමේ සංයුතිය: 1975 - 2021




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2021 වසරේ මැද භාගයේ සිට විධිමත් මාර්ග හරහා ලැබෙන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පහත වැටීම ආරම්භ විය. අපනයන ආදායමේ කැපී පෙනෙන වර්ධනය අභිබවමින්, තෝරා ගත් ආනයන සඳහා ආනයන සීමා පැනවීම අඛණ්ඩව පැවතීම මධ්‍යයේ වුවද ආනයන වියදම් විශාල ලෙස ඉහළ යෑම හේතුවෙන්, පසුගිය වසර දෙක තුළ පහත බැස තිබූ වෙළඳ හිඟය, විශේෂයෙන්ම 2021 වසරේ දෙවන භාගයේ දී සැලකිය යුතු ලෙස පුළුල් විය. වසංගත කාලසීමාවෙන් පසුව සිදු වූ, විශේෂයෙන් ම වෙළඳ හිඟය, සේවා ගිණුම වෙත වූ ලැබීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සම්බන්ධයෙන් වූ මෙම අහිතකර වර්ධනයන් ආදිය දැනටමත් දුර්වලව පවතින විදේශීය අංශයේ අවදානම් තවදුරටත් උග්‍ර කර ඇත.


#### මූල්‍ය ගිණුමේ දුර්වල කාර්ය සාධනය

විදේශීය සෘජු ආයෝජන සම්බන්ධ ව්‍යුහාත්මක සහ ප්‍රතිපත්තිමය ගැටලු හේතුවෙන් පශ්චාත් යුධ සමය තුළ දී පවා ශ්‍රී ලංකාවට විදේශීය සෘජු ආයෝජන වැනි ණය නොවන විදේශ මූල්‍ය ප්‍රවාහ අපේක්ෂිත මට්ටම් දක්වා ආකර්ෂණය කරගැනීමට නොහැකි වී ඇත. පසුගිය දශකය තුළ, වාර්ෂික විදේශීය සෘජු ආයෝජන ලැබීම් සාමාන්‍ය වශයෙන් එ. ජ. ඩොලර් බිලියන 1.3ක් පමණ වූ අතර එය ද.දේ.නි.යෙන් සියයට 1-2ක් අතර පැවතුණි. ශ්‍රී ලංකාවේ පවතින දුර්වල ආයෝජන වාතාවරණය කෙරෙහි, අවිනිශ්චිත ප්‍රතිපත්ති, සීමාකාරී කම්කරු රෙගුලාසි, ව්‍යාපාර කිරීමේ පහසුවෙහි ප්‍රගතියක් නොමැතිකම, දේපළ හිමිකම් සුරැකීමේ නොගැළපීම් සහ නීතිය හා සාමය පවත්වාගෙන යෑමේ දුර්වලතා ඇතුළු සාධක රාශියක් හේතු වී ඇත. මීට අමතරව, දූෂණය, දුර්වල රෙගුලාසි, ඉහළ නිලධාරිවාදය හා දුර්වල යටිතල පහසුකම් වැනි ආයතනික දුර්වලතා හේතුවෙන් ශ්‍රී ලංකාව එහි සම ආර්ථිකයන්වලට වඩා සැලකිය යුතු ලෙස අඩු විදේශීය සෘජු ආයෝජන ලැබීම් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට හේතු වී ඇත.

#### විදේශීය ණය මට්ටම ඉහළ යෑම


පසුගිය දශකය තුළ ඉහළ යන ලද විදේශීය ණය සහ ණය සේවාකරණ ගෙවීම් විදේශීය අංශයේ අසමතුලිතතාවයන්ට ප්‍රධාන වශයෙන් හේතු විය. 2007 වසරේ දී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීමෙන් අරමුදල් රැස් කිරීම හරහා, ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමත් සමඟ, විදේශ ණය අඛණ්ඩව ඉහළ යමින් පවතී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව සහනදායී පොලී අනුපාතවලට ලබා ගැනීමට හුරු වී සිටි සංවර්ධන මූල්‍යාධාරවලට සාපේක්ෂව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ඉහළ පොලී අනුපාතවලට මිල කරනු ලැබීම නිසා එමගින් ණය මූල්‍යයනය කිරීමේ සමස්ත පිරිවැය ඉහළ ගොස් ඇත. තවද, පශ්චාත් යුද ආර්ථික පුනර්ජීවනය සමඟ විශාල යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා මුදල් යෙදවීම හේතුවෙන් පුළුල් වූ රාජ්‍ය මූල්‍ය හිඟය ද මෙම ඉහළ යෑමට දායක විය. ණය සමුච්චය වීමේ ප්‍රවණතාවය අනුව, පසුගිය දශකය තුළ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස විදේශීය ණය මට්ටම ද ක්‍රමයෙන් ඉහළ යමින් පවතින අතර, එය සාමාන්‍ය වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 60ක් පමණ වේ. කලාපයේ රටවල් සමඟ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස විදේශීය ණය සැසඳීමේ දී භූතානය, මාලදිවයින සහ කාම්බෝජයට පසු ඉහළම අනුපාතය ශ්‍රී ලංකාව වාර්තා කර ඇත. මෙම රටවල් හතර හැරුණු විට, ආසියාවේ අනෙකුත් රටවල්හි දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස විදේශීය ණය එම රටවල දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 50කටත් වඩා අඩු මට්ටමක පවතී.

**රූප සටහන වි.ස. 2.2**
**විදේශීය සෘජු ආයෝජන ලැබීම්:**
**ශ්‍රී ලංකාව සහ තෝරාගත් කලාපීය රටවල් - 2020**





මූලයන්: ලෝක බැංකුව
වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ
එක්සත් ජාතීන්ගේ සමුළුව (UNCTAD)
ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන වි.ස. 2.3**
**නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය:**
**ශ්‍රී ලංකාව සහ තෝරාගත් කලාපීය රටවල් - 2020**




මූලයන්: ලෝක බැංකුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන වි.ස. 2.4**
**ශ්‍රී ලංකාවේ විදේශීය ණය සේවාකරණ ගෙවීම්: 2000 - 2021**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

***විදේශීය ණය සේවාකරණ ගෙවීම්***

විදේශීය ණය තත්ත්වය වැඩි වීම මෙන්ම ශ්‍රී ලංකාවේ විදේශීය ණය සංයුතිය සහනදායී ණයවල සිට පිරිවැය අධික සහනදායී නොවන සහ වාණිජ ණය ගැනීම් දක්වා වෙනස් වීම විදේශීය ණය සේවාකරණ ගෙවීම් ඉහළ යෑමට හේතු වී ඇත. විදේශීය ණයවල අධික පිරිවැය, ගෙවුම් තුලනයේ ජංගම ගිණුම මත තවදුරටත් පීඩනයක් ඇති කරමින් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය පුළුල් කර ඇත. ශ්‍රී ලංකාවේ වාර්ෂික අපනයන ආදායමෙන් තුනෙන් එකක් පමණ ණය සේවාකරණය සඳහා යෙදවෙන බව පිළිබිඹු කරමින් සමස්ත විදේශීය ණය සේවාකරණ ගෙවීම් වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනවල ප්‍රතිශතයක් ලෙස 2011 වසරේ දී පැවති සියයට 13.2ක සිට 2021 වසර වන විට සියයට 30.0ක් දක්වා වැඩි වී ඇත. තවද, විදේශීය ණය සේවාකරණ ගෙවීම්වලින් සියයට 80කට වඩා වැඩි ප්‍රමාණයක් රජයේ ණය සේවාකරණ ගෙවීම් වන අතර, ඉන් විදේශීය අංශයේ මූල්‍යකරණ ගැටලු ප්‍රධාන වශයෙන් රාජ්‍ය මූල්‍ය අසමතුලිතතා හේතුවෙන් පැන නගින බව පිළිබිඹු කරයි.

***දළ නිල සංචිත පහත වැටීම***

ප්‍රමාණවත් නොවූ විදේශ විනිමය ලැබීම් හමුවේ ඉහළ විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම් හේතුවෙන් 2021 වසර අවසාන වන විට රටේ දළ නිල සංචිත තත්ත්වය තියුණු ලෙස  පහළ මට්ටමකට වැටී ඇත. අපනයන ඉපැයීම් රට තුළට ගෙන්වා ගැනීම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ විදේශ ප්‍රාග්ධන ප්‍රවාහ යනා දී විදේශ විනිමය ලැබීම් අඩු මට්ටමක පැවතීම නිසා දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතා හිඟයක් ඇති වූ අතර, සංචිත මට්ටම් තවදුරටත් පහළ යෑමට හේතු වෙමින් අත්‍යවශ්‍ය ආනයන මූල්‍යනය කිරීම සඳහා විදේශ විනිමය සැපයීමට මහ බැංකුවට සිදු විය.

***විනිමය අනුපාතිකය මත ඇති වූ සැලකිය යුතු පීඩනය***

දේශීය විදේශ විනිමය වෙළඳපොළේ සිදී ගිය ද්‍රවශීලතා තත්ත්ව, විනිමය අනුපාතිකය මත සැලකිය යුතු අවප්‍රමාණය වීමේ පීඩනයක් ඇති කළ ජාත්‍යන්තර සංචිතවල අවිනිශ්චිත මට්ටම සහ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම් යනාදිය මගින් විදේශීය අංශයේ අසමතුලිතතා විශාල ලෙස පිළිබිඹු කෙරේ. ප්‍රධාන වශයෙන්, මහ බැංකුවේ ශිෂ්ට ප්‍රයෝග හරහා 2021 වසරේ බොහෝ කාලයක් තුළ සහ 2022 වසරේ මාර්තු මස මුල දක්වා විනිමය අනුපාතිකය එ.ජ. ඩොලරයට සාපේක්ෂව රු. 200  203ත් අතර අගයක පවත්වා ගනු ලැබූ අතර, විදේශ විනිමය සඳහා කැපී පෙනෙන සමාන්තර අවිධිමත් වෙළඳපොළක් ඇතිවීම දක්නට ලැබුණි. කෙසේ වෙතත්, 2022 වසරේ මාර්තු මස මුල සිට විනිමය අනුපාතිකයේ ඇති වූ ගැළපීම සහ ඉන් අනතුරුව ඇති වූ වෙළඳපොළ පීඩනය සමඟ 2022 වසරේ මාර්තු මස අවසානය වන විට එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 33.0කින් විශාල ලෙස අවප්‍රමාණය විය. කෙසේ වෙතත්, මූල්‍ය හිඟයන් පියවා ගැනීම සඳහා මූල්‍යයන සපයා ගැනීමට අවශ්‍ය සාකච්ඡා ද සමඟ, 2022 වසරේ අප්‍රේල් මස මුල දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සැලකිය යුතු ලෙස දැඩි කිරීම සහ ප්‍රධාන වශයෙන් ආර්ථිකය නැවත සකස් කිරීමේ වැඩසටහනක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල  සමඟ සාකච්ඡා ආරම්භ කිරීම, විදේශීය ණය සේවාකරණය අතුරු කාලපරිච්ඡේදයක් සඳහා නතර කිරීම හරහා ක්‍රමවත්ව සහ එකඟතාවයකින් යුතුව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියකට යොමු වීම සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය වැනි දැනට සලකා බලමින් පවතින අනෙකුත් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග වහාම ක්‍රියාත්මක කිරීම තුළින් විනිමය අනුපාතිකයේ යම් ස්ථාවරත්වයක් ඇති වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**විදේශීය අංශයේ ස්ථාවරත්වය ළඟා කර ගැනීම සඳහා වන මැදි හා දිගු කාලීන ප්‍රතිපත්ති**

විදේශීය අංශයේ ගැටලු විසඳීම සඳහා මහ බැංකුව පසුගිය කාලය තුළ කෙටිකාලීන ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත. භාණ්ඩ හා සේවා අපනයනයෙන් ලැබෙන ආදායම අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් මහ බැංකුව විසින් නව නීති නිකුත් කළ අතර, ඒවා දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතා තත්ත්ව ඉහළ නැංවීමට උපකාරී විය. තවද, ණය නොවන මූලාශ්‍ර හරහා දළ නිල සංචිත ගොඩ නැංවීමේ අරමුණින්, එසේ රුපියල්වලට පරිවර්තනය කරන ලද විදේශ විනිමයෙන් කොටසක් මහ බැංකුවට විකිණීමට මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් ලබා දෙන ලදී. මෙම ක්‍රියාමාර්ගය දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතාවයට යම් බලපෑමක් ඇති කළ ද, එමගින් අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා වන ඉල්ලුමෙන් කොටසක් මූල්‍යනය කිරීම සඳහා වෙළඳපොළට අවශ්‍ය විදේශ විනිමය සැපයීමට මහ බැංකුවට හැකි විය. බලපත්‍රලාභී බැංකුවලින් රුපියල්වලට

පරිවර්තනය කරනු ලබන විදේශ විනිමය ප්‍රේෂණ සඳහා සාමාන්‍ය විනිමය අනුපාතිකයට වඩා වැඩි දිරිගැන්වීම් ලබාදීම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලට අදාළ ගනුදෙනු පිරිවැය ප්‍රතිපූරණය කිරීම සහ "ලංකා රෙමිට්" (Lanka Remit) නම් වූ ජාතික ප්‍රේෂණ ජංගම යෙදුම ක්‍රියාත්මක කිරීම හරහා විධිමත් මාර්ග ඔස්සේ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් දිරිමත් කිරීමට පියවර ගන්නා ලදී. තවද, අනේවාසිකයන්ට ලබා දෙන සේවා සඳහා විදේශ විනිමය වශයෙන් පමණක් ගෙවීම් භාර ගැනීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති හෝටල් සේවා සපයන්නන්ට විධානයන් නිකුත් කරන ලදී. එපමණක් නොව, ද්විපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකම් මගින් කලාපීය මහ බැංකුවලින් විදේශීය මූල්‍ය ආධාර ලබා ගැනීමට ද මහ බැංකුව සමත් වී ඇත. කෙටි කාලීන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග විදේශීය අංශය නැවත යථා තත්ත්වයට පත් කිරීමට යම් ප්‍රමාණයකට උපකාරී වී ඇතත්, විදේශීය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමට සහ අඛණ්ඩ ස්ථාවරත්වය පවත්වා ගැනීමට මැදි හා දිගු කාලීන ප්‍රතිපත්ති අවශ්‍ය වේ. එවැනි ප්‍රතිපත්ති පහත ප්‍රධාන ක්ෂේත්‍ර මත පදනම් විය යුතුවේ.

***මැදි කාලීන ක්‍රියාමාර්ග***

***ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබන ආර්ථික ගැළපුම් වැඩසටහනකට අනුකූල වන ලෙස පුළුල් සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම***

රට මුහුණ දී ඇති අඛණ්ඩ ආර්ථික ගැටලු සැලකිල්ලට ගනිමින්, සාර්ව ආර්ථික ස්ථාවරත්වය ඉලක්ක කර ගන්නා ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් මූල්‍යයනය කරනු ලබන වැඩසටහනකට අනාගතයේ දී යොමු වීම සඳහා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා ආරම්භ කිරීමට තීරණය කර ඇත. මෙම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මූල්‍ය වැඩසටහන, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය, රජයේ වාණිජ ව්‍යවසායයන්වල මූල්‍ය කාර්ය සාධනය ශක්තිමත් කිරීම, රාජ්‍ය අයවැය මහ බැංකුව මගින් මූලන්‍ය කිරීම ක්‍රමානුකූලව අඩු කිරීම සහ සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන්වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම වැනි ප්‍රධාන ක්ෂේත්‍රවල පුළුල් ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයක් ඔස්සේ සිදු කළ හැක.

***විදේශීය ණය තිරසාර බව සහතික කිරීමේ අවශ්‍යතාවය***

රජයේ සහ මහ බැංකුවේ වත්මන් අවධානය යොමු වී ඇත්තේ ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සඳහා දිගු කාලීනව රටේ විදේශීය ණයවල තිරසාර බව සහතික කිරීම වෙතයි. මේ සම්බන්ධයෙන්, රජය විසින් තම විදේශීය ණය තිරසාර ලෙස කළමනාකරණය කිරීම සඳහා මූල්‍ය උපදේශකයින් සහ නීති උපදේශකයින් පත් කිරීම සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් යෝජනා කැඳවීම දැනටමත් ප්‍රකාශයට පත් කර ඇත. එවැනි ණය කළමනාකරණ ක්‍රියාවලියකට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනක් සඳහා වන එකඟතාව මත පදනම් වූ පුළුල් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මක් ඇතුළත් විය හැකිය. ඊට සමගාමීව, එකඟතාවයකින් යුතුව විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් සඳහා තාවකාලිකව විදේශීය ණය සේවාකරණය අතුරු කාලපරිච්ඡේදයක් සඳහා අත්හිටුවන බව රජය 2022 වසරේ අප්‍රේල් මස 12 වන දින නිවේදනය කර ඇත. මෙම ක්‍රියාමාර්ග, ඉහළ මට්ටමක පවතින විදේශීය ණය අඩු කිරීම තුළින් විදේශීය ණය තිරසාරභාවය තහවුරු කිරීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

***දළ නිල සංචිත යහපත් මට්ටමක පවත්වාගෙන යෑම***

විදේශීය අංශයේ ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා, දළ නිල සංචිත යහපත් මට්ටමක පවත්වා ගැනීම ඉතා වැදගත් වන අතර, එය රටෙහි බාහිර කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව මෙන්ම විදේශීය ණය සේවාකරණ ගෙවීම් කිරීමට ඇති හැකියාව පිළිබඳ දර්ශකයකි. එබැවින්, රටේ දළ නිල සංචිත ඉහළ නැංවීම විදේශීය අංශයේ වැදගත්ම මැදි කාලීන අරමුණ වේ. අවම වශයෙන් මාස 4ක වෙළඳ භාණ්ඩ ආනයන ආවරණය වන පරිදි දළ නිල සංචිත ඉහළ නැංවීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි. මෙම ඉලක්ක සැලකිය යුතු ලෙස අභියෝගාත්මක වන අතර, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා දැනට දරන ප්‍රයත්න සහ අපේක්ෂා කරන ලද විදේශ විනිමය ලැබීම් මැදි කාලයේ සිට දිගු කාලීනව ක්‍රමානුකූලව ඉහළ යෑම තුළින් දළ නිල සංචිත ක්‍රමයෙන් ගොඩනගා ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදි කාලීන අරමුණ සංචිත ප්‍රමාණය ක්‍රමානුකූලව ඉහළ නැංවීම වන අතර, ණය නොවන මූලාශ්‍ර හරහා සංචිත ගොඩ නැගීම මගින් එහි සංයුතිය ද වැඩි දියුණු කිරීමට අපේක්ෂා කෙරේ.

***කලාපීය සහයෝගීතාව ශක්තිමත් කිරීම***

මැදි කාලීනව විදේශීය අංශයේ ස්ථායීතාව තිරසාර කිරීම පිණිස පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ගොඩනැගීම සඳහා කලාපීය මහ බැංකු, රජයයන්, ව්‍යාපාරික ප්‍රජාවන්, ආයෝජකයින් සහ බහුපාර්ශ්වික නියෝජිතායතන ඇතුළු කලාපීය පාර්ශ්වකරුවන් සමඟ ජාත්‍යන්තර සහයෝගීතාව පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන්, මහ බැංකුව විසින් කලාපීය රටවල් කිහිපයක් සමඟ අනාගත සහයෝගිතා පිළිබඳ සාකච්ඡා අඛණ්ඩව කරගෙන යනු ලබයි.

***ණය නොවන විදේශ විනිමය ලැබීම් ශක්තිමත් කිරීම සඳහා වූ දිගු කාලීන ක්‍රියාමාර්ග***

***වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන අංශ ප්‍රවර්ධනය කිරීම***

ඉහළ විදේශ විනිමය ඉපැයීම් ලබා ගැනීම සඳහා භාණ්ඩ හා සේවා අපනයන කර්මාන්ත යන දෙකටම සහාය වීමට ජාතික අපනයන ක්‍රමෝපාය උපකාරී වේ. ශ්‍රී ලංකාව නවෝත්පාදනවලින් සමන්විත අපනයන කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ අරමුණින් දැනට පවතින ජාතික

1

අපනයන ක්‍රමෝපාය සකස් කොට ක්‍රියාත්මක කරන ලද අතර, එය 2018-2022 දක්වා වසර 5 තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලදී. ජාත්‍යන්තර වෙළඳාමේ මෑත කාලීන වර්ධනයන්ට සරිලන පරිදි ජාතික අපනයන ක්‍රමෝපාය නවීකරණය කිරීම සහ අපනයන ක්ෂේත්‍රයට අත්‍යවශ්‍ය ප්‍රතිපත්තිමය සහාය ලබා දීම වැදගත් වන අතර එවැනි ප්‍රතිපත්ති ඕනෑම දේශපාලන තන්ත්‍රයක් යටතේ වුව ද බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය. පුළුල් සහ ස්ථාවර ජාතික අපනයන ක්‍රමෝපායක් ක්‍රියාත්මක කිරීම අපනයනවල ස්ථාවර සහ තිරසාර වර්ධනයක් ඇති කිරීමට අපේක්ෂා කරන අතරම නව රැකියා අවස්ථා නිර්මාණය කිරීමට සහ ගෝලීය අගය දාම සහ නිෂ්පාදන බෙදාහැරීම් ජාලයන්හි වැඩි සහභාගීත්වය තුළින් අගය එකතු කිරීමට පහසුකම් සැලසීමට විභවයක් සහිත අපනයන ක්ෂේත්‍රවලට අවස්ථාව සලසා දෙනු ලැබේ. මේ සමඟ, විශේෂයෙන්ම අපනයන අංශය සඳහා අතරමැදි භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්ත සඳහා සහ ප්‍රධාන වශයෙන් ගෝලීය වෙළඳාම කෙරෙහි යොමු වූ කර්මාන්ත සඳහා වෙළඳ අංශයට ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ ක්‍රියාමාර්ග හඳුන්වා දී අධීක්ෂණය කළ යුතුය.

සාම්ප්‍රදායික වෙළඳ භාණ්ඩ අපනයනවලට වඩා ඉහළ විභවයක් සහිත සහ දේශීය අගය එකතු කරන සේවා අංශයේ අපනයන ප්‍රවර්ධනය කිරීමට සමාන අවධානයක් යොමු කළ යුතුය. පාස්කු ඉරු දින ප්‍රහාරවලින් සහ කොවිඩ්-19 වසංගතයෙන් දැඩි ලෙස පීඩාවට පත් වුව ද මෑත වසරවල දී සේවා ගිණුමේ අතිරික්තයට සංචාරක ඉපැයීම් ප්‍රධාන දායකත්වයක් ලබා දී ඇත. සංචාරක ව්‍යාපාරය එහි විභවයන් කරා ළඟා වීම සඳහා අඛණ්ඩව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛත්වය දිය යුතුය. භාණ්ඩ හා සේවා අපනයන ඉපැයීම් ශක්තිමත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍රවලට පැවරීම, ප්‍රවාහන හා වරාය සේවා වැනි අනෙකුත් සේවා අංශ ද ජාතික සැලැස්මට එක් කළ යුතුය.

### විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ නැංවීම

කොවිඩ්-19 වසංගතයේ අහිතකර බලපෑම් ක්‍රමයෙන් පහව යෑම සහ ඉලක්කගත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමත් සමඟ, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වර්ධනය වීමේ සලකුණු පෙන්නුම් කර ඇත. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වන සංක්‍රමණික ශ්‍රමිකයන් සංඛ්‍යාවේ ඉහළ යෑමෙන් විදේශ රැකියා සඳහා පිටත්ව යෑම ඉහළ යමින් පවතින බව පිළිබිඹු වේ. තවද, නිල විනිමය අනුපාතිකය සහ අවිධිමත් වෙළඳපොළ තුළ පවතින විනිමය අනුපාතිකය අතර වෙනස අඩුවීම නිල මාර්ග තුළින් ඉහළ විදේශ ප්‍රේෂණ ආකර්ෂණය කර ගැනීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. විදේශ රැකියා ප්‍රවර්ධනය, විදේශ රැකියා වෙළඳපොළ විවිධාංගීකරණය කිරීම සහ සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ කුසලතා ඉහළ නැංවීම සඳහා ක්‍රියාකාරී පාර්ශ්වකරුවන්ගේ දායකත්වය හරහා ඉහළ ආදායම් සහිත විදේශ රැකියා අවස්ථා වැඩි ප්‍රමාණයක් සුරක්ෂිත කිරීමට අපේක්ෂා කරන අතර, එමගින් පුළුල් වන වෙළඳ හිඟයේ බලපෑම සමනය කර ගැනීම සඳහා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් දක්වන දායකත්වය වැඩි කරගත හැක.

### විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම

මෑදි කාලීනව විදේශීය සෘජු ආයෝජන වැනි ණය නොවන විදේශ මූල්‍ය ප්‍රවාහ යහපත් මට්ටමක පවත්වා ගැනීම සඳහා, ප්‍රතිපත්ති අනුකූලතාව පවත්වා ගැනීම, ව්‍යාපාර පවත්වාගෙන යෑමට අවශ්‍ය තත්ත්ව වැඩිදියුණු කිරීම, ආයතන ශක්තිමත් කිරීම සහ විදේශීය සෘජු ආයෝජනවලට පහසුකම් සැලසීම සඳහා වූ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම හා අනුමැතිය ලබා දීම කඩිනම් කිරීම වැදගත් වේ. කොළඹ වරාය නගරය සංවර්ධනය කිරීම, කොළඹ සහ හම්බන්තොට වරායන් භාණ්ඩ වෙළෙඳ කේන්ද්‍රස්ථාන ලෙස ප්‍රවර්ධනය කිරීම සහ දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයින් සඳහා නවීන ආයෝජන කලාප ඇති කිරීම හරහා ඉදිරි කාලසීමාව තුළ සැලකිය යුතු විදේශීය ආයෝජන මෙරටට ගෙන්වා ගැනීමට අපේක්ෂා කෙරේ. දිගුකාලීන සාර්ව ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම පිණිස එවැනි ආයෝජන සඳහා පහසුකම් සැලසීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා සමීප සම්බන්ධීකරණ සහ අධීක්ෂණ යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.

### සමාප්තිය

ආර්ථික ගැළපුම් වැඩසටහනක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා ආරම්භ කිරීම, විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා කැපවීම, සැලකිය යුතු ලෙස මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම සහ වඩාත් වෙළඳපොළ මත පදනම් වන ලෙස විනිමය අනුපාතිකය පවත්වා ගැනීම ඇතුළුව රජය සහ මහ බැංකුව විසින් ගනු ලබන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග, ඉදිරි කාලපරිච්ඡේදයේ දී ආර්ථිකය තුළ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය යළි ස්ථාපිත කිරීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දශක ගණනාවක් තිස්සේ නැවත නැවතත් ඇති වන විදේශීය අංශයේ අස්ථාවරත්වයට මූලික හේතුව ලෙස පැවති විදේශීය ජංගම ගිණුමේ හිඟය සහ රාජ්‍ය මූල්‍ය හිඟය අවම කිරීම සඳහා දිගු කලක් තිස්සේ නොසලකා හරින ලද ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ නුදුරු අනාගතයේ දී හඳුන්වා දීම අත්‍යවශ්‍ය වේ. විදේශීය අංශයට අහිතකර ලෙස බලපාන ආර්ථික ගැටලුවලට ඔරොත්තු දීම සඳහා හිතකර සංචිත මට්ටමක් පවත්වා ගන්නා අතරම, රටේ විදේශීය ණයවල තිරසාර බව සහතික කිරීම සඳහා තිරසාර මට්ටම්වලින් ද්විත්ව හිඟයන් කළමනාකරණය කිරීම ඉතා වැදගත් වන අතර, එමගින් විදේශීය අංශයේ දිගුකාලීන ස්ථාවරත්වය තහවුරු වනු ඇත.

---

මූලාශ්‍ර

1. Central Bank of Sri Lanka. (1998). *Economic Progress of Independent Sri Lanka.* Colombo: Central Bank of Sri Lanka

2. Central Bank of Sri Lanka. (2011). *40th Anniversary Commemorative Volume.* Colombo: Central Bank of Sri Lanka